# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2233/16 - 2021 ජූනි මස 22 වැනි අඟහරුවාදා - 2021.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

කඩුගන්නාව නගර සභාවේ

**විනෝද බදු පැනවීම**

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාවේ 2020.07.23 වැනි දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක (එ) 2 (II) යටතේ සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව ඉහත කී විනෝද බදු ආඥාපනතේ දෙවන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ වන මා විසින් අනුමත කරන ලද බවට එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

නීතිඥ ලලිත් යූ. ගමගේ,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2021 ජනවාරි මස 18 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

*යෝජනාව*

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව, නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට දහයකට (10%) සමාන බද්දක් පනවා අයකළ යුතු යැයි ද, මෙම යෝජනා සම්මතය *ගැසට් පත්‍රයේ* පළ කරන ලද මාසයට එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක කිරීමට ද යෝජනා කරමි.

06 - 404

1A - PG 5473 — 30 (2021/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*